# නොතේරෙන සංරචක හෙවත් නොදන්නා දෙමළය - 2

බයිලා කතුවරයාගේ බයිලා කිහිපයක් පිළිබඳ ව අපි ගිය සතියේ සඳහන්කෙළෙමු. අවසාන වශයෙන් අප සාකච්ඡාකරමින් සිටියේ මුවර් මුස්ලිමුන් යනුවෙන් සඳහන්වන ජනයා පිළිබඳව ය. බයිලා කතුවරයාගේ අසංගත ප්‍රකාශ අනුව මුවර් මුස්ලිමුන් සිංහල ජනතාව අතර ජීවත්වෙමින් සිංහල කතාකරන පිරිසක් බවට පත්වූ නමුත් සිංහල නො වූයේ බුදුදහම වැළඳ නොගත් බැවිනි. මොහු මෙයින් කීමට තැත්කරන්නේ යම් ජනවර්ගයක් සිංහලවීම සඳහා අනිවාර්ය සාධකයක් වනුයේ ඔවුන් බුදුදහම වැළඳගැනීම බව ද ? න්‍යායකට අනුව තර්කකිරීමට නොදත් බයිලා කතුවරයාගෙන් එවැනි ප්‍රශ්න අසන්නේ ඔහුගේ තරම පාඨකයාට දැනගැනීමට සැලැස්වීමට මිස ඔහුගෙන් සංගත පිළිතුරු බලාපොරොත්තුවෙන් නො වේ. සිංහලවීම සඳහා බුදුදහම වැළඳගැනීම අනිවාර්ය වන්නේ නම් මැලේ මුස්ලිමුන් සමස්තයක් ලෙස ගත්කල බුදුදහම වැළඳ නොගෙන සිංහල වී ඇත්තේ කෙසේදැයි ඔහු තේරුම්කර දිය යුතු ය. ඒ අතර අප දැනගැනීමට කැමති තවත් කරුණක් වෙයි. යම් සිංහල බෞද්ධයකු බුදුදහම අත්හැර කතෝලික ආගම හෝ වෙනත් ක්‍රිස්තියානි ආගමක් හෝ වැළඳ ගතහොත් ඔහුගේ සිංහලකමට කුමක් සිදුවේ ද ? සිංහලවීම සඳහා බුදුදහම වැළඳගැනීම අනිවාර්ය යැයි කීව ද සිංහල බෞද්ධයකු බුදුදහම අත්හැරියහොත් සිදුවන්නේ කුමක් දැයි ඉන් ගම්‍යනොවන බැවින් බයිලා කතුවරයාගෙන් ඒ ප්‍රශ්නය ඇසිය යුතුව ඇත.

විවිධ කුලවල ජනයා විවධ කාලවල භාරතයෙන් පැමිණ ඇති බව බයිලා කතුවරයා කියන්නේ සමාජ විද්‍යාඥයන් කිහිප දෙනකුගේ අදහස් මත පදනම්වීය. එහෙත් මේ සමාජ විද්‍යාඥයන් නිශ්චිතව නොකියන කරුණක් වෙයි. එනම් මේ කුලවල, විශේෂයෙන් ම කරාව, දුරාව හා සලාගම කුලවල ආරම්භය කෙසේ සිදුවිණි ද යන්න ය. ශ්‍රී මහා බෝධින් වහන්සේ වැඩම කරද්දිද කුල සංක්‍රමණයක් සිදුවූ බව ඉතිහාසයෙහි සඳහන්වෙයි. එයටත් පෙර විඩිධ කුල මෙරට පැවතියේ ද ? භාරතයෙන් විවිධ කාලවල පැමිණි ජනයා ඒ ඒ කාලයේ දී එවකටත් පැවති කුලවලට අවශෝෂණය කරගනු ලැබුවෝ ද ? භාරතයෙන් ඇතැම් කාලවල පැමිණි ජනයා අවශෝෂණය කරගනු ලැබුයේ ඉහත සඳහන් කුලවලට පමණක් නො වේ. එසේ පැමිණි ඇතැම්හු ගොයිගම කුලයට ද අවශෝෂණය කරගනු ලැබූහ. පාණදුර බණ්ඩාරගම මාර්ගය අසල ජීවත්වන එවැන්නන් ගැන මම දනිමි. මේ අවශෝෂණවල කිසි ප්‍රශ්නයක් නැත. එමෙන් ම භාරතයෙන් හෝ වෙනත් දේශයකින් හෝ පැමිණ කිනම් කුලයක් ඔස්සේ හෝ සිංහල ජාතියට අවශෝෂණය වූ පිරිස්වල සිංහල කමේ අඩුවක් ද නැත. බයිලා කතුවරයා මේ සාධක ඉදිරිපත්කරන්නේ කුමක් සඳහාදැයි පැහැදිලි නැත. ඔහුට කීමට අවශ්‍ය වන්නේ භාරතයෙන් පැමිණි පිරිස් සිංහල ජාතියට මෙන් ම දෙමළ ජනවර්ගයට ද අවශෝෂණය වී ඇති බව ද ? ඒ එසේ නම් එහි කීමට තරම් දෙයක් නැත.

එහෙත් අප ගිය සතියේ ද සඳහන්කර ඇති පරිදි භාරතයෙන් පැමිණි ඇතැම් පිරිස් දෙමළ වූවා නම් එසේ වී ඇත්තේ මෙරටට සංක්‍රමණය වූ දෙමළ ජනයා නිත්‍ය පදිංචිකරුවන් බවට පත්විමෙන් පසුව මිස පෙර නොවේ. යාපනය විශ්වවිද්‍යාලයේ පළමු ඉතිහාස මහාචාර්යවරයා වූ මහාචාර්ය කාර්තිගේසු ඉන්ද්‍රපාල මහතා නිශ්චිතව පවසන්නේ එවැනි නිත්‍ය දෙමළ වාසස්ථාන එකොළොස්වැනි සියවසට පෙර ඇති නොවූ බව ය. දෙමළ ජනයා අතර සිටින කරෙයිවර් කුලයේ ආරම්භය කෙසේ සිදුවිණි ද ? භාරතයෙන් එක් වකවානුවක දී පැමිණි පිරිසක් කරෙයිවර් කුලයට පසුව ඇතුලත් කරගන්නට ඇත. එහෙත් මේ කුලයේ ආරම්භය කෙසේ සිදුවිණි ද ? දෙමළ ජනයා අතර වෙල්ලාල කුලය ආරම්භවූයේ කෙසේ ද ? ඔවුන් එකොළොස්වැනි සියවසට පෙර සංක්‍රමණය වී යැයි කිව නො හැකි ය. මේ වෙල්ලායෝ ලන්දේසීන් විසින් දුම්කොළ වගාව සඳහා දකුණු ඉන්දියාවේ කෝරමණ්ඩල වෙරළින් ගෙන එනු ලැබූ ගොවියන්ගෙන් පැවත එන්නෝ වෙති. වෙල්ලාල යන්නෙහි තේරුම ගොවි යන්න ය. කරෙයිවර් කුලය ඇරඹුණේ වෙල්ලාල කුලය ඇරඹීමට පෙර ද පසු ද ? කරෙයිවර් කුලයේ ආරම්භකයෝ පසුව දෙමළ වූ යාපනයේ ජීවත්වූ සිංහල කරාව කුලයේ ජනයා ද ? එසේ දෙමළ වීමේ දී කරාව යන්න කරෙයිවර් බවට පත්විණි ද ? සිංහල කරාව කුලයේ හා දෙමළ කරෙයිවර් කුලයේ යම් පිරිසක් කතෝලික වීමට හේතුව කුමක් ද ? දෙමළ කරෙයිවර කතෝලිකයෝ දෙමළ වී පසුව කතෝලික වූවෝ ද ? එසේත් නැතහොත් පෘතුගීසීන්ගේ බලපෑමෙන් කතෝලික වූ යාපනයේ සිටි සිංහල කරාව ජනයා පසුව වෙල්ලාලයන් එහි බහුතරය බවට පත්වීමෙන් පසුව දෙමළ වී ද? බයිලා කතුවරයා සඳහන්කරන සමාජ විද්‍යාඥයන් කියනු ලබන්නන්ට මේ ප්‍රශ්නවලට පිළිතුරු ඇත් ද ? ඔවුන්ට ඒ ප්‍රශ්නවලට පිළිතුරු ඇතත් නැතත් මා දන්නා කරුණක් වෙයි. එනම් යාපනයේ කතාකරන දෙමළ හා තමිල්නාඩුවේ කතාකරන දෙමළ අතර පරතරය අවුරුදු තුන්සිය පණහකට හැටකට නොවැඩිවිය හැකි බව ය ; මෙරට වත්මන් දෙමළ ජනයාගේ ඉතිහාසය ලන්දේසීන්

© Prof. Nalin De Silva

දුම්කොළ වගාවට කෝරමණ්ඩල වෙරළින් මිනිසුන් ගෙන ඒමෙන් පසුව ආරම්භවන බව ය. දෙමළ ජනයාගේ ඉතිහාසයක් ඇතිවීමට පළමුවෙන් ම දෙමළ නිත්‍ය වාසස්ථාන තිබිය යුතු ය. එහෙත් මෙයින් කියැවෙන්නේ සිංහල සංස්කෘතියට දෙමළ බලපෑමක් ඉන් පෙර නොවූ බව නො වේ. ඒ නම් සංස්කෘතියට බී නම් සංස්කෘතියෙහි බලපෑමක් ඇතිවීමට බී නම් සංස්කෘතියෙහි ජනයා ඒ නම් සංස්කෘතිය ඇති රටෙහි නිත්‍ය පදිංචිකරුවන් වීම අනිවාර්ය නො වේ. සිංහල සංස්කෘතියට පල්ලව ආභාසය ලැබී ඇත්තේ පල්ලවයන් මෙරට නිත්‍ය පදිංචිකරුවන් වී නො වේ.

(4) බයිලා කතුවරයා මෙසේ කියයි. “ සංස්කෘතියෙහි දී එක ප්‍රවාහයක් නොව ප්‍රවාහ කිහිපයක් තිබුණි. ඒ අතර සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රධාන විය. ” බයිලා කතුවරයා කීමට අදහස්කරන්නේ ඈත අතීතයේ සංස්කෘතික ප්‍රවාහ කිහිපයක් තිබූ බවත් ඉන් සිංහල බෞද්ධ ප්‍රවාහය ප්‍රධාන වූ බවත් ය. මෙහි දී අඩුම තරමින් සිංහල බෞද්ධ ප්‍රවාහය ප්‍රධාන වී යැයි කීමට ඔහුට සිදුවෙයි. ඔහු නොකියන කරුණ නම් මේ අනෙක් සංස්කෘතික ධාරාවන් මෙරට කොපමණ කලක සිට තිබුණි ද යන්න ය. එනම් සිංහල බෞද්ධ සංස්කෘතියෙන් බාහිරව වෙනම සංස්කෘතික ධාරාවන් ලෙස සංස්කෘතික ධාරාවන් කීයක් කිනම් කලක සිට පැවතිණි දැයි ඔහු නිශ්චිත ව නො කියයි. ඒ වෙනුවට කරෙයිවර් කුලය කතෝලික වීම ගැන බයිලා කියයි. පණ්ඩුකාභය රජු දවස මෙරට සිංහල ජාතිය බිහිවීම ආරම්භවීමෙන් පසුව දේවානම්පිය තිස්ස රජු දවස නිලවශයෙන් සිංහලයන් බෞද්ධයන් වී දුටුගැමුණු රජු දවස සිංහල බෞද්ධ රාජ්‍යය පිහිටුවනු ලැබිණි. ශත වර්ෂ ගණනාවක් තිස්සේ මෙරට තිබුණේ සිංහල බෞද්ධ සංස්කෘතිය ය. ඉන් කියැවෙන්නේ ඒ සමජාතීය වූ බව නො වේ. ලොවේ කිසිම තැනක සමජාතීය සංස්කෘති තිබී නැත. ඕනෑම සංස්කෘතියක ප්‍රාදේශීය වෙනස්කම් වෙයි. එහෙත් ප්‍රාදේශීය වෙනස්කම් හේතුකොටගෙන සංස්කෘතියක අනන්‍යභාවය නැති නොවේ. එමෙන් ම සංස්කෘතියකට වෙනත් සංස්කෘතියකින් යම් යම් අංග අවශෝෂණය වීම හේතුවෙන් පළමු සංස්කෘතියෙහි අනන්‍යභාවය නැතිවන්නේවත් දෙවැනි සංස්කෘතියක පැවැත්මක් තහවුරුවන්නේවත් නැත.

බයිලා කතුවරයාට මේ කරුණු පිළිබඳ කිසි දැනීමක් නැත. ඔහු වරක් මා සමග පැවති රූපවාහිනී දේශපාලන සංවාදයක දී (රූපවාහිනියේ වත්මන් ආකෘතියේ දේශපාලන සංවාද ඇරඹුණේ ඒ සමඟින් යැයි සිතමි. ඒ චන්ද්‍රිකා කුමාරතුංග යුගයේ රූපවාහිනියේ ප්‍රබුද්ධයන්ට අවශ්‍ය වූයේ බයිලා කතුවරයා අතින් මා පරාජය වී සිංහල බෞද්ධ විරෝධී මතය ජයග්‍රහණය කරනු දැකීම ය. අද “යුද්ධයට” පක්ෂව ලියන කියන ඇතැම් ප්‍රබුද්ධයෝ එදා එයට විරුද්ධවූහ. බයිලා කතුවරයා එකල චන්ද්‍රිකා කුමාරතුංගට සිතුවිලිවලින් සමීප විය.) හෙළිදරවු වූයේ බයිලා කතුවරයා මහා හඬින් කතාකරන ඇතැම් දේ ගැන ඔහුට කිසිම අවබෝධයක් නොතිබූ බව ය. ලකුණු ප්‍රමිතිකරණය යනු කුමක්දැයි නොදැන ඔහු ලකුණු ප්‍රමිතිකරණය ගැන කතා කෙළේ පඬිබවක් ආරූඪ කරගනිමිනි ! කරෙයිවර් කුලයක් ගැන කතාකිරීමට පළමුව එහි සම්භවය ගැනත් මෙරට දෙමළ සංස්කෘතිය ඇරඹුණේ කවදාදැයි කීමටත් බයිලා කතුවරයා උත්සාහ ගන්නේ නම් මැනවි. එසේ නැතහොත් ඔහු කරන්නේ නොදන්නා දෙමළයට ගොස් වරිගෙ නසාගැනීමකි. මේ පුවත්පත් සංවාදය වෙනුවට බයිලා කතුවරයාට ප්‍රසිද්ධ විවාදයකට අභියෝග කරමි. එවිට කාලෝ ෆොන්සේකා, වික්‍රමබාහු කරුණාරත්න ආදීන්ට මෙන් ම මහුට ද තමන් කවුදැයි හඳුනාගැනීමට හැකිවනු ඇත.

(5) බයිලා කතුවරයා අවසානයේ දී සඳහන්කරන්නේ නව ජාතිය නිර්මාණයකිරීම ගැන ය. ඔහු මෙසේ කියයි. “මහාචාර්යවරයා ප්‍රධාන සංරචකය පිළිබඳව ලියන විවරණයේ දී නව ජාතියක් නිර්මාණයකිරීමේ ප්‍රශ්නය ගැන ද කතාකිරීමට උත්සාහ කර තිබේ. ලාංකික ලෙස සිතන අය රටේ විරල බව ඔහු කියයි. ලාංකික නමින් ජාතියක් ඇති නම් එහි භාෂාව කුමක් ද යන ප්‍රශ්නය ඔහු මතු කරයි. ඔහු සිතන්නේ දැනටමත් ජාතියක් බවට පත්ව ඇති සිංහල ප්‍රවාහයට ජාතියක් බවට පත්ව නැති අන් වර්ග ද එකතුවීම මඟින් සියලු දෙනා සිංහල සංස්කෘතියේ ම අතුරු සංරචක බවට පත්වී මෙම අර්බුදය විසඳාගත යුතු බව ය.” මා සිතන දේ ගැන ඔහු දැනගන්නේ කිනම් ඥානයකින් ද ? සිතන දේ තබා ලියා ඇති දේවත් අවබෝධකරගැනීමට ඔහුට නො හැකි ය. අපි පළමුව මා මේ සම්බන්ධයෙන් සංස්කෘතියෙහි ප්‍රධාන සංරචකය ලිපියෙහි කියා ඇත්තේ කුමක් දැයි බලමු. “එහෙත් දෙමළ හා (මුවර්) මුස්ලිම් ජනයා එසේ සිංහල වී නැත. වර්තමානයේ ඔවුන් සිංහල කිරීමට කතාකිරීම නිෂ්ඵල ක්‍රියාවකි.” දෙමළ හා (මුවර්) මුස්ලිම් ජනයා සිංහල කිරීමට කතාකිරීම නිෂ්ඵල බව මා පැහැදිලිව පවසා තිබිය දී ඔහු අනෙකක් ම කියයි.
(මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva